# ශ්‍රී ලාංකාවේ ග්‍රන්ථ මාධ්‍යයේ සමකාලීන ව්‍යවහාර, සීමා සහ බාධා

කුමේෂ් ප්‍රභාෂිණී ගමගේ
කථිකාචාර්ය -ජනමාධ්‍ය අධ්‍යයන අංශය,
ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය
+94718499774
k.prabhashini@gmail.com

## 1. හැඳින්වීම

සබුද්ධික ශිෂ්ටාචාරගත වූ මානවයා ස්වකීය ආර්ථික, දේශපාලන, සංස්කෘතික, ආගමික හා සමාජීය චින්තාවන් සටහන් තබනු පිණිස ග්‍රන්ථ මාධ්‍යය ව්‍යවහාරයට ගත් බවට ඓතිහාසික සාක්ෂ්‍ය රාශියකි. ක්‍රි. පූ. 200 දී පමණ ආරම්භ වූ මැටි පුවරු ලේඛන කලාවේ සිට ක්‍රි. පූ. 3500 දී පමණ ඊජිප්තු වැසියන් සොයා ගත් පැපිරස් ලේඛන මාධ්‍යය දක්වා ම ඉහත අරමුණ පැවතිණි. හෝමර් විසින් රචිත "ඉලියඩ්" කාව්‍යය පැපිරස් මත රචනා වීමත් ඇලෙක්සැන්ඩ්‍රියාවේ රාජකීය පුස්තකාලයේ (The Royal Library of Alexandria) සියලුම ලිපිලේඛන පැපිරස් මත රචනා වීමත් මේ අතර සාක්ෂ්‍ය වේ. මානව ශිෂ්ටාචාරයේ ලිඛිත සන්නිවේදනයේ ආරම්භය මීට වසර දහස් ගණනකට පූර්වයෙන් සිදු වුව ද වසර 4000 කට පෙර සිට පැවත එන පොත වූ කලී ඔහු විසින් නිර්මාණය කරන ලද සංකීර්ණ හා විස්මයජනක තවත් එක් නිර්මාණයකි.

ක්‍රි.ව. 868 දී පමණ චීන භාෂාවෙන් රචනා වූ "වජ්ජ සූත්‍රය" ලෝකයේ ප්‍රථම මුද්‍රිත කෘතියයි. මෙය Diamond Sutra හෙවත් දියමන්ති සූත්‍රය ලෙසද හඳුන්වයි. ගුටෙන්බර්ග් විසින් මුද්‍රණය කළ ශුද්ධ වූ බයිබලය(පේළි 42 බයිබලය) 15 වැනි ශතවර්ෂයේ කාර්මික මුද්‍රණ කටයුතු ආරම්භ වීමත් සමඟ නිෂ්පාදනය කරන ලද අතර එවක රෝමානු කතෝලික දහම මධ්‍යතන යුරෝපීය ජනතාව වෙත සන්නිවේදනය කරන ලදී. එසේ ආරම්භ වූ බහුවිධ පිටපත් සහිත පොත් (Multiple Copy Book) මානව කියවීම සඳහා වූ පොත් (The Man Reading Book) බවට පත් වූයේ 19 වැනි සියවසේ දී ය (දයාරත්න,2006, පිː52).

"පොත්" යන්නට ව්‍යවහාර වූ පුස්තක රැසක් ඊජිප්තු සොහොන් ගැබ් තුළින් සොයා ගෙන ඇත. වීර කතා, ගමන් විස්තර, පවුලේ තොරතුරු, මැජික් ඒවායෙහි අන්තර්ගත ව පැවතිණ. ඒ අතුරින් මළවුන්ගේ ග්‍රන්ථය (Book of the Dead) විශේෂ පුස්තිකාවක් වේ. ඕනෑ ම පුද්ගලයෙකු මියගිය පසු ඔහුගේ ආත්මය පිළිබඳ තීන්දුවක් දෙවියන් වහන්සේ විසින් ගන්නා ලද බවට පුරාණ ඊජිප්තු වාසීන් අතර ප්‍රාථමික විශ්වාසයක් විය. ඒ සඳහා දෙවියන් විසින් අසනු ලබන ප්‍රශ්න හා ඒවාට දිය යුතු පිළිතුරු සංගෘහිතව මළවුන්ගේ ග්‍රන්ථ තුළ විස්තර කොට ඇත.මියගිය පුද්ගලයන්ගේ ආත්මයට මග පෙන්වීමක් මෙම පොත්වලින් කර තිබුණි. මේ නිසා සෑම ධනවත් පුද්ගලයෙකු විසින් ම පාහේ මෙම පොතේ පිටපතක් ලබා ගන්නා ලදී. මළවුන්ගේ පොත නිපදවීම මේ නිසා ලාභදායී ව්‍යාපාරයක් විය. ඒ අනුව ලෝකයේ ප්‍රථමවරට පොත් වෙළෙඳාම ආරම්භ වූයේ අවමංගල උත්සවවලින් යයි කිව හැකි ය (වීරසිංහ,2001,පිː15-16).

ක්‍රි. පූ. 197-149 පාර්ගමන්හි දෙවන ඉයුමිනස් (Eumenes) රජු සොයා ගත් "පාර්ච්මන්ට්" හෙවත් "වෙලම්" සත්ත්ව හම් ආශ්‍රිත ලේඛන ද්‍රව්‍යයක් විය. බැටළුවන්, ගවයන්, එළුවන් වැනි සතුන්ගේ හම් යොදා සකස් කළ පැරණිතම පිටපත වූයේ වතිකානු පුස්තකාලයේ දැනට සුරක්ෂිතව ඇති වර්ජිල් (Virgil) පුස්තකයයි. අතීත රෝමයේ ග්‍රන්ථකරණය සඳහා වහලුන් යොදා ගන්නා ලදී. එක් වහලෙකු පොතක් හඬ නගා කියවන අතර තවත් වහල්ලු පිරිසක් එය පිටපත් කළහ. පොත් කර්මාන්තයේ ප්‍රකාශකයන් බිහි වීමට පෙරාතුව සිදු වූයේ වහලුන් (Slave copyist) මගින් පොත් පිටපත් කරවීම ය. එක් අයෙකු පිටපත කියවන අතර, හොඳින් ලියන්නට දන්නා වහල්ලු පිරිසක් එය පිටපත් කළහ (දයාරත්න,2006, පි:15).

ශ්‍රී ලාංකිකයන්ට විධිමත් ලේඛන කලාවක් හා අධ්‍යාපන ක්‍රමයක් බිහිවන්නේ මහින්දාගමනයට පසුව වුවත් ඊට පූර්වයේ එකී ව්‍යවහාරයන් පැවති බවට ඓතිහාසික සාක්ෂි වේ. ක්‍රි.පූ. 250-210 කාලයේ දේවානම්පියතිස්ස රජුට අධ්‍යාපනය ලබා දුන් ගොබුකි බ්‍රාහ්මණයාගේ සෙල්ලිපි ඊට කදිම සාක්ෂි වේ. ශ්‍රී ලංකා බෞද්ධ අධ්‍යාපනයත් සමඟ වර්ධනය වූ භික්ෂු අධ්‍යාපනය බෞද්ධ පොතපත නිර්මාණයෙහි ලා ප්‍රමුඛ විය. පාලි ත්‍රිපිටකය සහ ථේරවාදී කතා අයත් ග්‍රන්ථ පරිශීලනය පිණිස බුද්ධඝෝෂ, බුද්ධදත්ත වැනි විදේශීය උගතුන් මෙරටට පැමිණ ඇත. වංස කතා සඳහන් කරන ආකාරයට මෙරට ග්‍රන්ථකරණය ද ආරම්භ වූයේ මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය සමඟ ය. ඉන්දියාවෙන් ගෙනා බෞද්ධ ග්‍රන්ථ දේශ භාෂාවෙන් ශිෂ්‍යයන්ට පැහැදිලි කරදීමත්, ඒවාට අර්ථ විවරණ කෙරුණු සාධකත් තිබේ. මුල් කාලයේ ග්‍රන්ථකරණ සම්ප්‍රදායක් ද, මුඛ පරම්පරාගත සම්ප්‍රදායක් ද ලක්දිව පැවතුණි. වරින්වර ඇති වුණු දේශපාලන සහ සමාජ ආර්ථික ගැටුම්වලට විසඳුමක් ලෙස ධර්මය ග්‍රන්ථාරූඪ කරන්නට සිදු විය. රාජාවලිය විග්‍රහ කරන ආකාරයට මෙරට පාලකයන්ගේ ජීවිතය, සමාජ සංසිද්ධි, ආගමික පූජස්ථාන සහ ශුද්ධ වස්තු ගැන තොරතුරු ඇතුළත් පුරාවෘත්ත ලේඛනගත කරන සම්ප්‍රදායක් පැවතුණි. පොත් පිටපත් කිරීමෙන් පොත් බහුල ව්‍යවහාරයට ගෙන ගිය හැකි ය (කාරියවසම්,2004, පි:01).

පුරාණ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණ ඉතිහාසයේ දී සුවිශේෂ වේ. ගමේ විහාරස්ථානය හෙවත් ගුරුගෙදර මූලික කර ගත් අධ්‍යාපනයේ දී දරුවාගේ මූලික අධ්‍යාපනය පිණිස වෛද්‍ය, නක්ෂත්‍ර හා ගණිතය පිළිබඳ පොතපත භාවිතයට පැමිණියේ ය. අ යනු කී අ යන්නේ කියා හෝඩිය කියැ වූ පුරාණයේ දරුවන් නම් පොත, මගුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කව්පොත, බුද්ධ ගජ්ජය, සකස්කඩ, නවරත්නය, නාමාෂ්ට ශතකය, ව්‍යාසකාරය, ප්‍රත්‍ය ශතකය, අනුරුද්ධ ශතකය, බෞද්ධ ශතකය හා සූර්ය ශතකය යන පොත් පෙළ මූලික අධ්‍යාපනය සඳහා භාවිත කළේ ය. වැලි පිල්ලේ ලිවීමෙන් හා මෙම ශතක පොත් කියවීමෙන් වෛද්‍ය, ගණිත, නක්ෂත්‍රස්ත්‍ර පිළිබඳ දැනුම පන්සලෙන් ම ලැබූහ (සේනාරත්න,2001,පි:60). එසේ ම මහාවංශය වීර කාව්‍යයක් නොහොත් වීර කාව්‍ය ලක්ෂණ ඇති ග්‍රන්ථයක් වශයෙන් සැලකෙයි. එපමණක් නොව ක්‍රි. පූ. 3 වැනි ශතකයේ සිට පැරණි බුදුසමය හැදී වැඩී දියුණු වූ මහා විහාරයේ වංස කථා වශයෙන් ද සලකනු ලැබේ. ඓතිහාසික ග්‍රන්ථයක් වශයෙන් මහාවංශයේ ඇති සත්‍යතාව පිළිබඳ එක් අවධියක විවිධ මත පළ වූ නමුත් ඒවාට නිසි පිළිතුරු ගෛගර් පඬිවරයා සපයා ඇත (එල්ලාවල,2002,පි:2-3).

ආරම්භයේ ආගමික සන්නිවේදනය සහ ඒවා සංරක්ෂණය අරමුණෙන් ග්‍රන්ථ මාධ්‍යය මෙරට ආරම්භ වුවත් පසුකාලයේ කර්මාන්තයක් ලෙස සුපෝෂණය වීම කෙරෙහි යටත්විජිතකරණය ඍජුවම බලපානු ලැබිණි. ලන්දේසීන් යටත්විජිත අරමුණු ව්‍යාප්තියෙහි ලා මුද්‍රණ ශිල්පය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමත් සමඟ පොත් ලිවීම, මුද්‍රණය හා බෙදා හැරීම ආරම්භ විය. කතෝලික දහම ව්‍යාප්තියෙහි ලා ග්‍රන්ථ මාධ්‍ය අවශ්‍ය බව අවබෝධ කොට ගත් ලන්දේසි පාලකයන් ප්‍රථම මුද්‍රිත සිංහල පොත වශයෙන් "ලංසි යාඥා පොත" 1737 දී මුද්‍රණය කරන ලදී. එසේ ආරම්භවී කර්මාන්තමය මුහුණුවර මේ සඳහා එක් වූයේ බ්‍රිතාන්‍ය පාලන යුගයේ ඇතිවූ පාසල් අධ්‍යාපනයත් සමඟයි. ශ්‍රී ලංකාවේ පොත් කර්මාන්තය නංවාලීමට මෑත දී සිදු වූ වර්ධනයක් නම්, සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ පොත් සංවර්ධන වැඩසටහනක් සඳහා ලෝක බැංකුවෙන් / අයි.ඩී.ඒ වෙතින් පෙර නොවූ විරූ සම්පත් ප්‍රමාණයක් යෙදවීමයි. අධ්‍යාපන පද්ධතිය තුළ පොත් ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වැඩිදියුණු කිරීම, පාසල් ළමුන් හා සාමාන්‍ය ජනතාව තුළ කියවීමේ පුරුද්ද ඇති කිරීම, පාසල් හා මහජන පුස්තකාල පද්ධතිය සංවර්ධනය කිරීම, කළමනාකරණ කුසලතා පිළිබඳ පුහුණුව, කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා අවස්ථා ලබා දීම සහ ස්ථාපිත කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා ආයතනය. නව පාසල් පුස්තකාල 2,000ක් පිහිටුවීමටත්, දැනට පවතින පුස්තකාල 1,000ක් වැඩිදියුණු කිරීමටත්, කතුවරුන්, නිදර්ශකවරුන්, පොත් නිර්මාණකරුවන්, පුස්තකාලයාධිපතිවරුන් ආදිය සඳහා පුහුණු පහසුකම් සැපයීමට ද ප්‍රතිපාදන සලසා ඇත (http://www.accu.or.jp/appreb/report/abd/abd3032.html, 2020.01.02).ඒ අනුව මෙම ලිපිය මඟින් ශ්‍රී ලාංකාවේ ග්‍රන්ථ මාධ්‍යයේ සමකාලීන ව්‍යවහාර, සීමා සහ බාධා පිළිබඳ විමර්ශනය කෙරේ.

## 2. ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ප්‍රකාශන කර්මාන්තයේ ආරම්භය

ඓතිහාසිකව ගත් කල අනෙකුත් සියලු ම රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද ආගමික, සංස්කෘතික හා දේශීය සාහිත්‍යයන් නිර්මාණය කරනු ලැබූයේ මුද්‍රිත මාධ්‍යයයි(Crawley, Page & Pinto-Jayawardana, 2015). 1739දී ලන්දේසි යටත්විජිත යුගයේ පළමු මුද්‍රණාලය මෙරටට හඳුන්වා දී මෙම තාක්ෂණය හඳුන්වා දීමේ ප්‍රධාන අරමුණ වූයේ ඔවුන්ගේ නීති සහ ක්‍රිස්තියානි සාහිත්‍යය ස්වදේශීය භාෂා වූ සිංහල හා දෙමළ මාධ්‍යයෙන් මුද්‍රණය කිරීමයි. එබැවින් ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තයට වසර සිය ගණනක් පැරණි පොහොසත් හා විචිත්‍රවත් උරුමයක් ඇත. කර්මාන්තයක් වශයෙන් 18 වන සියවසේ දී ආරම්භ වූයේ යුරෝපීය මැදිහත්වීම සහ නවීන අපනයනය 1980 දශකයේ ආරම්භ වීමත් සමඟයි. එය අද්‍යතනයේ සැලකිය යුතු වර්ධනයක් හා දියුණුවක් ඇති ක්ෂේත්‍රයකි. කෙසේ වෙතත්, නූතන මුද්‍රණය ලෙස අප හඳුනා ගන්නේ පශ්චාත්-නිදහස් යුගයේ සිට පැවත එන ක්ෂේත්‍රයයි. එතෙක් මුද්‍රණය බොහෝ දුරට බටහිර යටත්විජිත බලවතුන් විසින් පාලනය කරන ලද ප්‍රකාශන කිහිපයකට පමණක් සීමා වූ අතර පොත් ප්‍රකාශන සහ පුවත්පත්වල දී එය බෙහෙවින් භාවිත විය. නිදහස ලැබීමට මොහොතකට පෙර ඇසෝසියේටඩ් ප්‍රවෘත්ති පත්‍ර සමාගම 1929 දී ලේක්හවුස් වෙත සංක්‍රමණය වූ අතර එය බොහෝ දුරට පුවත්පත්වල මුතුන් මිත්තන්ගේ නිවස ලෙස සැලකේ. මෙය ජාතික නිදහස් අරගලයට සමගාමී ව පැවති අතර නිදහසින් පසු යුගය

වන විට මුද්‍රණ කර්මාන්තය ශ්‍රී ලංකාවේ කාර්මික අංශවල ප්‍රධාන අංගයක් වී තිබුණේ එය යුගයේ සංස්කෘතික හා සමාජ-ආර්ථික තත්ත්වයන් නිර්වචනය කළ බැවිනි (http://slap.lk, 2017.11.24).

1970 දශකයේ එවකට පරිපාලනයෙන් හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය වැඩි වැඩියෙන් සමාගම් පිහිටුවීමට සහ ආනයන අපනයන ආර්ථිකය තුළ වැඩි විදේශීය නිෂ්පාදන ශ්‍රී ලංකාවට පැමිණීම ද එක හා සමාන්තරව සිදු විය. මෙම යුගයේ දී, ඕෆ්සෙට් මුද්‍රණය තරමක් අලුත් වූ නමුත් පොරොන්දු වූ ආදායම හේතුවෙන් බොහෝ සමාගම් එම ක්ෂේත්‍රය තුළ නිරත විය. මුද්‍රණ කටයුතු පිළිබඳ බලාපොරොත්තුවක් ඇති කිරීමට උපකාර කළ ප්‍රධාන ආයතනයක් වූයේ රජයේ මුද්‍රණාලයයි. ශ්‍රී ලංකා මුද්‍රණකරුවන්ගේ සංගමය (SLAP) 1956 වන විට පිහිටුවන ලද අතර මේ වන විට විදේශීය ප්‍රදර්ශනවලට සහභාගී වූ විශාල කර්මාන්තයක් දක්වා වර්ධනය වී ඇති අතර කර්මාන්තයට බොහෝ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා බොහෝ විශාල ව්‍යාපාරවල සාර්ථකත්වය හේතු විය. ශ්‍රී ලංකාවේ මුද්‍රණයේ ප්‍රධාන සංගම් වන්නේ ශ්‍රී ලංකා මුද්‍රණාල සංගමය, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මුද්‍රණ ආයතනය සහ ග්‍රැෆික් ශ්‍රී ලංකා ලිමිටඩ්, ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමයයි (www.srilankabusiness.com, 2019.02.10).

කෙසේ වෙතත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය ග්‍රන්ථ, සඟරා, පුවත්පත් ඇතුළු මුද්‍රිත නිෂ්පාදනයන්ට අමතර ව බොහෝ දුරට අපනයන ලෙස තේ සහ ඇඟලුම් කර්මාන්තය මත රඳා පවතී. ඇසුරුම් පරිමාව සහ ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන වීම නිසා මෙය ඉතා පැහැදිලි තේරීමක් විය හැකිය. එහෙත් ඉන් ඔබ්බට ඇති තත්වය බොහෝ ගැටලුවලට මුහුණ දී සිටී. වැඩිවන ප්‍රතිලාභ හේතුවෙන් ශ්‍රී ලංකාවට තේ සහ ඇඟලුම් අපනයන පදනම් කරගත් මුද්‍රණ හා ඇසුරුම්කරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට හැකි විය. කෙසේ වෙතත්, ගෝලීය මට්ටමින් තේ සඳහා ඇති ඉල්ලුම අඩුවීමත් සමඟ මුද්‍රණ කර්මාන්තයට විශාල පීඩනයක් එක් කරමින් පරිමාව පහත වැටී ඇත.

## 3. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ මාධ්‍යයේ සමකාලීන භාවිතය

### 3.1. සමකාලීන ශ්‍රී ලංකාවේ පොත් කර්මාන්තය

සමකාලීන ශ්‍රී ලංකාවේ පොත් කර්මාන්තය ලෝකයේ පොත් කර්මාන්තය හා සසඳන කල කර්මාන්තයක් ලෙස පිබිදීමට අවශ්‍ය තාක්ෂණය, අමුද්‍රව්‍ය හා මානව හා භෞතික සම්පත් අතින් සිටිනුයේ ප්‍රාථමික මට්ටමක ය. පාසල් පෙළපොත් නිෂ්පාදනයට අමතර ව සෑම වසරක ම සැප්තැම්බර් මාසයේ පැවැත්වෙන ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය ද මෙරට තවමත් පොත් කියවීමේ පාඨක සංඛ්‍යාවක් සිටින බව පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 අප්‍රේල් මාසයේ සංඛ්‍යාලේඛන දත්තයන්ට අනුව අලුතින් නිකුත් කළ ISBN අංක ප්‍රමාණය 3251 ක් වන අතර ISSN අංක ප්‍රමාණය 51කි. තව ද, නවතම යුනෙස්කෝ සංඛ්‍යාලේඛනවලට අනුව, 1996 දී ශ්‍රී ලංකාව මාතෘකා 4,115 ක් යටතේ පොත් නිෂ්පාදනය කර ඇත. දකුණු ආසියාවේ බොහෝ රටවල් මෙන් නොව, ශ්‍රී ලංකාවේ ජාතික පොත් සංවර්ධන කවුන්සිලය අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ ස්ථිර ආයතනයකි. එහි අරමුණු

හා ක්‍රියාකාරකම් අතර කියවීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම, දේශීය කතුවරුන් හා ප්‍රකාශකයන් දිරිගැන්වීම, පොත් කර්මාන්තකරුවන් සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධාන කිරීම, ළමා පොත් ලියන ලේඛකයන්ට සහ චිත්‍ර ශිල්පීන්ට සහාය වීම, පොත් ප්‍රදර්ශන සංවිධාන සහ පුස්තකාල සංවර්ධනය ඇතුළත් වේ(https://www.accu.or.jp,2020.01.02).

සෑම වසරක ම ජූනි මාසයේ මහනුවර ප්‍රදේශයේ පැවැත්වෙන "කැන්ඩි බුක් ෆෙයාර්" පොත් ප්‍රදර්ශනය ද, සැප්තැම්බර් මාසයේ කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය හෙවත් "කොලොම්බෝ ඉන්ටර්නැෂනල් බුක් ෆෙයාර්" මෙන් ම දකුණු අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය හෙවත් "සදර්න් ෆෙස්ටිවල් ඔෆ් බුක්ස්" ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශකයන්, කර්තෘවරුන් මෙන් ම පාඨකයන් ද එක්කරන කදිම වේදිකාවකි. අන්තර්ජාතික පොත් ප්‍රදර්ශනය යනු පොත් ප්‍රදර්ශනයක් වන අතර ඔවුන්ගේ පුස්තකාල සේවා, අධ්‍යාපන සම්පත්, ප්‍රබන්ධ, පින්තූර පොත්, අන්තර්ක්‍රියාකාරී පොත් සහ ශ්‍රව්‍ය පොත් සහ තවත් බොහෝ දේ ප්‍රදර්ශනය කරන ප්‍රදර්ශකයින් එක් කරයි. එසේම අන්තර්ජාතික පොත් සල්පිල් වන SIBP සාජා, බීජිං සහ නවදිල්ලියේ පැවති ලෝක පොත් ප්‍රදර්ශනයන්ට ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන ලද පොත් රාශියක් ඉදිරිපත් කර ඇත. එසේ ම ග්‍රන්ථ රචකයන් සම්මානයට පත් කරන්නා වූ රජත පුස්තක සම්මානය, ස්වර්ණ පුස්තක සම්මානය සහ ගොඩගේ සාහිත්‍ය සම්මානය තව දුරටත් පොත් නිෂ්පාදන ක්ෂේත්‍රය පවත්වාගෙන යාම සඳහා ග්‍රන්ථ රචකයන්ට සිදුකරන දිරි ගැන්වීමකි.

## 3.2. සමකාලීන ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශන ක්‍රමවේද

1. ප්‍රකාශන සමාගමක් මඟින් ප්‍රකාශනය

මහා පරිමාණයෙන් පොත් ප්‍රකාශනය ආරම්භ වූ දා සිට ප්‍රකාශන සමාගම් ප්‍රකාශන කර්මාන්තයේ ඉදිරියෙන් ම සිටී. ශ්‍රී ලංකාව කුඩා රටක් වුව ද ශාස්ත්‍රීය, අධ්‍යාපනික, ළමා පොත් නිෂ්පාදනය ආදී විවිධ ශානරයන්ට අයත් පොත් ප්‍රකාශනයේ නියැලෙන ප්‍රකාශන සමාගම් කිහිපයක් ශ්‍රී ලංකාවේ ද ක්‍රියාත්මක වේ. සෑම ප්‍රකාශකයෙකුට ම තමන්ගේ ම වෙළෙඳ නාමයක් ඇති බැවින් ඒවා වෙත ළඟා වීමට පෙර සමාගම විසින් ප්‍රකාශයට පත් කරන ලද වෙනත් කෘති පරීක්ෂා කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ පොත් ප්‍රකාශකයන්ගේ සංගමය හා සම්බන්ධ ව කටයුතු කරන පොත් ප්‍රකාශකයන් මෙන් ම ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්තව සිටින පොත් ප්‍රකාශකයන් ද ග්‍රන්ථ ප්‍රකාශනයෙහි නිරත වේ.

2. ස්වයං ප්‍රකාශනය

ස්වයං ප්‍රකාශනය ශ්‍රී ලංකා ප්‍රකාශන කර්මාන්තයේ නව්‍ය ක්‍රමවේදයක් නොවේ. ශ්‍රී ලංකා සාහිත්‍යයේ ප්‍රවීණ කතුවරයකු වූ මාර්ටින් වික්‍රමසිංහ වරෙක ස්වයං ප්‍රකාශකයෙක් ද විය. ඔහු සිය කෘති ප්‍රකාශයට පත් කළේ මවුන්ට් ප්‍රෙස් නමින් වන ඔහුගේ ම මුද්‍රණාලයෙනි. ප්‍රකාශන සමාගම ඔස්සේ ග්‍රන්ථ මුද්‍රණය සඳහා තිබෙන අධික තදබදය, කර්තෘවරුන් සඳහා ප්‍රකාශකයන් ඉදිරිපත් කරන කොන්දේසි සහ ඇතැම්විට අයකරනු ලබන මුදල යන සාධක මත ස්වයං ප්‍රකාශන සඳහා යොමුවනු දක්නට ලැබේ. නවකතා කර්තෘ සුමිත්‍රා රාහුබද්ද (2019) ප්‍රකාශ කර සිටින්නේ "මම කර්මාන්තයට පිවිසෙන විට සාම්ප්‍රදායික ප්‍රකාශකයන් සිටියේ සීමිතවයි. ලේඛකයෙකු ලෙස මට කිසිවිටෙකත් ප්‍රකාශන කර්මාන්තයට පිවිසීමේ අදහසක් නොතිබුණි, ඒ වෙනුවට මගේ ලිවීම දිගට

ම කරගෙන යාමට මට අවශ්‍ය විය. ආධුනික ලේඛකයෙකු ලෙස, මම ස්ථාපිත ප්‍රකාශකයන් හෝ මගේ පළමු නවකතාව මුද්‍රණය කිරීම සඳහා ප්‍රකාශකයන්ට නිර්දේශ කළ හැකි අයෙකු සමග කිසිදු සම්බන්ධයක් නොතිබුණි. කෙසේ වෙතත්, අද දින මම දිගින් දිගට ම ප්‍රතික්ෂේප කිරීම ආශීර්වාදයක් ලෙස සලකන්නේ ලේඛකයෙකු මෙන්ම කර්මාන්තයේ ස්වයං ප්‍රකාශකයෙකු ලෙස මා හට ස්ථාපිත විය හැකි වූ බැවිනි"(http://www.sundayobserver.lk/2019/09/29/spectrum/self-publishing, 2020.01.02).

3. ඊ-පොත්

විද්‍යා ප්‍රබන්ධ සහ මනඃකල්පිත වැනි ශානරීය කෘති සඳහා ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි සාහිත්‍ය වෙළෙඳපොළේ එතරම් ඉඩක් නොමැති වුව ද මෙම අවකාශයන්හි කතුවරුන් සඳහා, ගෝලීය වෙළෙඳපොළට මාර්ගයක් තිබීම ඉතා වටී. ශ්‍රී ලංකාවේ කියවීම් අතිවිශාල වශයෙන් සිදු වන්නේ සිංහල භාෂාවෙන් වුව ද, එය ප්‍රධාන වශයෙන් ඉංග්‍රීසියෙන් ගනුදෙනු කරන ගෝලීය වෙළෙඳපොළෙන් බැහැර කරයි. එසේ ම, විශේෂිත ඊ-රීඩර් (e-reader) උපාංග මිල අධික වන අතර ජනප්‍රිය ආකෘතියක් ලෙස විද්‍යුත් පොත් (electronic books) පැතිරීම සීමා කිරීම් රට තුළ නොමැත. ඊබුක් (e-book) සෑම විට ම සිත්ගන්නා විවාදයකි. මෙම නව තාක්ෂණය ශ්‍රී ලංකාවේ ප්‍රකාශන කර්මාන්තය සඳහා දේශීය ප්‍රකාශකයෙකු, මුද්‍රණ ශිල්පියෙකු සහ පොත් අලෙවිකරුවෙකු වන එම්.ඩී. ගුණසේන, මයික්‍රොඉමේජ් සහ එටිසලාට් සමග එක්ව "බුක් හබ් රීඩර්" විද්‍යුත් පොත් කියවනය නමින් වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරයි. එම්.ඩී. ගුණසේන සමාගමේ නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ, රජීව් ගුණසේන(2019) ප්‍රකාශ කර සිටිනුයේ "මුද්‍රණ ධාවනයේ පිරිවැය හේතුවෙන් අත් පිටපත් දහස් ගණනක් ප්‍රතික්ෂේප වන අතර මෙම නවෝත්පාදන උපාංගය පරිශීලකයන්ට කරදරයකින් තොරව කියවීමට, ගවේෂණය කිරීමට සහ වෙබ් අඩවි නැරඹීමට වැඩි කාලයක් ගත කිරීමට ඉඩ සලසයි. හොඳම අලෙවිකරුවන්, නව නිකුතුවන්, සම්භාව්‍යයන්, නවීන සම්භාව්‍යයන් සහ මහජන පුස්තකාලවලින් ලබා ගත හැකි පොත් පරිගණකයක් ආධාරයෙන් ලබා ගැනීමට පරිශීලකයන්ට හැකි වේ.

එසේම, kiyawamu.lk වෙබ් අඩවිය යනු විද්‍යුත් තැපැල මාර්ගිකව විද්‍යුත් පොත් කියවීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකාවේ ආරම්භ වූවකි. මෙම ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහාය ලබා දෙන්නේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයයි. මෙම වෙබ් අඩවියේ සමාරම්භක උත්සවය 2017 සැප්තැම්බර් 15 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ දී සිදු විය.

4. රජයේ අරමුදල්

නිශ්චිත කාණ්ඩයේ ප්‍රකාශන ලබා දීම සහ අදාළ ක්ෂේත්‍රයේ කතුවරුන් දිරිමත් කිරීමේ අරමුණින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය රාජ්‍ය යාන්ත්‍රණයක් වශයෙන් ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය ඔස්සේ පොත් ප්‍රකාශන කාර්යය සඳහා රාජ්‍ය මැදිහත්වීම ලබාදෙයි. ගුණාත්මක දේශීය ප්‍රකාශන නොමිලයේ ලබා දීම, රටේ ප්‍රකාශන කර්මාන්තයට උදව් කිරීම,කතුවරුන්, පරිවර්තකයන් සඳහා සහාය වීම, ප්‍රකාශනවල ගුණාත්මකභාවය හා ප්‍රමිතිය වැඩි දියුණු කිරීම,කියවීමේ පුරුද්ද

ප්‍රවර්ධනය කිරීම, ප්‍රකාශනවල මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීම මෙම ආයතනය මඟින් සිදු කරයි. ඒ අනුව 1984 සිට ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය කතුවරුන්ට ඔවුන්ගේ කෘති ප්‍රකාශයට පත් කිරීමට සහාය වී තිබේ. ආධාර කිරීම හුදෙක් ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය අරමුදල් සැපයීම පමණක් නොව පොතෙහි අන්තර්ගතය, ආවරණ පිටුව, පිටු සැකැස්ම, කඩදාසි ගුණාත්මකභාවය සහ නිමාව යන කරුණු මණ්ඩලය සලකා බලයි. තව ද ජාතික කියවීමේ මාසය 2004 දී ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය එක්ව ඔක්තෝබර් මාසයේ ප්‍රකාශිත පොත් අතර ප්‍රසිද්ධියක් ලබා දීමේ අරමුණු කරයි. පොත් කියවීමට මිනිසුන් උනන්දු කරවීම / පෙලඹවීම මෙම මාසය තුළ රාජ්‍ය මැදිහත්වීමෙන් සිදුවේ. ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ සංගමය ද ග්‍රන්ථ ප්‍රකාශනය සහ සංවර්ධන ක්‍රියාවලියේ සුවිශේෂී ආයතනයක් වේ. මෙම සංගමයේ සාමාජිකයින් 155 දෙනෙකු සිටින අතර ප්‍රකාශන ප්‍රමිතිය වැඩිදියුණු කරමින් කර්මාන්තයේ වර්ධනය සක්‍රියව ප්‍රවර්ධනය කරයි. එසේම අවබෝධතා ගිවිසුම අත්සන් කර ජාත්‍යන්තර හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමද සිදු කරයි. පොත් ප්‍රකාශකයන්ගේ සංගමය චීනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම එයට කදිම උදාහරණයකි.චීන කොමියුනිස්ට් පක්ෂයේ නායකත්ව කණ්ඩායමේ පක්ෂ ලේකම් සහ මහජන චීන සමූහාණ්ඩුවේ මාධ්‍ය, ප්‍රකාශන, ගුවන්විදුලි, චිත්‍රපට හා රූපවාහිනී රාජ්‍ය පරිපාලන උප අමාත්‍ය ජියැං ජියැන්ගු සහ ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයින්ගේ සභාපති විජිත යාපා  මෙම ගිවිසුමට අත්සන් තැබූ අතර එය පොත් ප්‍රදර්ශනවලට සහභාගී වීමට පහසුකම් සැලසීම මෙන් ම දෙරටේ අන්‍යෝන්‍ය පරිවර්තනය හා ගුණාත්මක කෘති ප්‍රකාශයට පත් කිරීම අරමුණු කර ගෙන ඇත.ප්‍රකාශන වෘත්තිකයන්ගේ හුවමාරුව දිරිගැන්වීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට අවබෝධතා ගිවිසුම දිරිමත් කරයි.

## 4. ශ්‍රී ලංකාවේ පොත් කර්මාන්තයේ නූතන සීමා සහ බාධා

සමකාලීන ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ මාධ්‍යය කෙරෙහි වන සීමා සහ බාධා කිහිපයක් මූලිකව හඳුනාගත හැකි ය. ඉන් පළමුවැන්න වන්නේ පොහොසත් කියවීමේ සංස්කෘතියක් නොමැතිකමයි.  මුද්‍රිත පොතපත හා බැඳුණු පාඨක සංඛ්‍යාව සීමිත වී ඇති බැවින් සහ මුද්‍රිත පොත්පත් නිෂ්පාදනයේ දැවැන්ත පසුබෑමක් ශ්‍රී ලංකාවේ සමාජ දේහය තුළ දක්නට ලැබේ. තරුණ පාඨක පිරිස් බොහෝ දුරට මාර්ගගත පොතපත සඳහා ප්‍රවේශ වීමේ පරිසරය නූතනයේ සිදුවෙමින් පවතින බැවින් මාර්ගගත පොත්පත් මුද්‍රණය හා නිෂ්පාදනය කෙරෙහි වන අවධානය යොමුකිරීමේ කාලීන අවශ්‍යතා නිර්මාණය වෙමින් පවතී. මෙතෙක් මුද්‍රිත පිටු කියවීමේ හුරුව සහිත ශ්‍රී ලාංකික පාඨකයා තුළ මාර්ගගත කියවීම් හැකියාව වර්ධනය කිරීම මෙම බාධව ජයගනු පිණිස කළ හැකි මැදිහත්වීමකි. ඒ සඳහා මාර්ගගත කියවීම් පහසු කරවන ආකාරයේ භාෂා සහ ලේඛන භාවිතයන් මෙන් ම ස්වදේශික භාෂාවන්ගෙන් පහසුවෙන් මාර්ගගත කියවීමකට අවශ්‍ය මෘදුකාංග සහ තාක්ෂණික උපකරණ බිහිවීම අත්‍යවශ්‍ය වී ඇත.

ග්‍රන්ථ කතුවරුන් සඳහා වෘත්තීයභාවයක් සහ පිළිගැනීමේ මඳකම හේතුවෙන් සීමිත කතුවරුන් කර්මාන්තයේ ඇත්තේ ලේඛකයන් ලෙස පමණි. ලෝකයේ ග්‍රන්ථ රචනාකරණයෙහි නියැලෙන්නන්ට රාජ්‍ය මට්ටමින්, සමාජ මට්ටමින්  සහ කර්මාන්තය තුළින් ලබාදෙන ගෞරවය

සහ නිසි පිළිගැනීම ශ්‍රී ලංකාව තුළ දී හිමිවනුයේ ඔවුන්ගේ සැඳෑ කාලයේ දී හෝ සැප්තැම්බර් මාසයේ ජාතික කියවීමේ මාසයට සමාන්තරව සංවිධාන වන උත්සව සහ ඇගයුම්වල දී පමණකි. ආර්ථිකමය සහ සාමාජීය වශයෙන් ග්‍රන්ථ කතුවරුන්ගේ වෘත්තීයභාවය ඇති කිරීම මෙම බාධාව වළක්වා ගැනීමට යහපත් ප්‍රවේශයකි.

නිෂ්පාදනය වන පොත් සංඛ්‍යාත්මකව සීමා සහිතවීම සහ විවිධත්වයන් මඳකම ද සීමා සහ බාධා ලෙස හඳුනාගත හැකි ය. ලෝකයේ පොත් වෙළෙඳපළ හා ගත් කල කර්මාන්තයක් ලෙස ග්‍රන්ථ මාධ්‍යයේ ඍණාත්මක සංවර්ධනය මේ සඳහා යම් ලෙසකින් බලපානු ඇත. ග්‍රන්ථ කතුවරුන්ට, පොත් ප්‍රකාශකයන්ට හිමිවිය යුතු ඉහත සාධක මත මෙම බාධාව ජයගත හැකි වේ.

ස්වදේශීය භාෂා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය පොත්පත් ඉංග්‍රීසි පරිවර්තනයන් ලෙස ප්‍රකාශයට පත් වී නොමැතිකම හේතුවෙන් ගෝලීය පොත් කර්මාන්තයේ සීමිත අවස්ථා පමණක් ශ්‍රී ලංකාවට හිමිවීම සීමාවක් සහ බාධාවක් වශයෙන් හඳුනාගත හැකි ය. රාජ්‍ය තාන්ත්‍රික ව විදේශීය රාජ්‍ය සමඟ ඇති කරගන්නා වූ ගිවිසුම් මඟින් සහ ස්වදේශික භාෂාවන්ගෙන් යුතු උසස් කෘති ඉංග්‍රීසි පරිවර්තනයන්ට ලක්කිරීම මෙය ජයගතහැකි ක්‍රමවේදයකි.

ශ්‍රී ලංකාව තුළ වැඩියෙන් ම අලෙවි වන්නේ පෙළ පොත් සහ විෂය සමගාමී අධ්‍යාපනික පොතපත බැවින් කියවීම සඳහා වන අරමුණු විනෝදාස්වාදය,ශාස්ත්‍රීය සහ ඥානගවේෂණය මෙන් ම අධ්‍යාපනික අරමුණ කෙරෙහි යොමු නොවීම බාධාවකි. කියවීමේ හුරුව විෂය කරුණු ඉගෙනීමකට පමණක් සීමා නොවන්නේ නම් මෙම ක්ෂේත්‍රය කෙරෙහි වන පාඨක යොමුවීමට ද වර්ධනය වේ.

## 5. නිගමනය

මානවයාගේ අතීතය - වර්තමානය - අනාගතය ඒකාබද්ධ කරන, අඛණ්ඩ ව පවත්වා ගෙන යන මාධ්‍යය වන්නේ පොත යි. 1972 ජගත් පොත් වසර වෙනුවෙන් රොනල්ඩ් බාර්කර් හා රොබර්ට් එස්කාර්පිට් ලියූ පොත් පවස කෘතියට අනුව වසර 4000 කටත් අධික කාලයක් පුරා පැවත එන පොත වූ කලී කදිම සන්නිවේදන මාධ්‍යයකි.ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ මාධ්‍යයේ සමකාලීන ව්‍යවහාර, සීමා සහ බාධා මෙම ලිපිය මඟින් ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ මාධ්‍යයේ ප්‍රභවය සහ නූතන භාවිතයන්ද ඒ සඳහා වන සීමා, බාධා සහ යෝජනා ද විග්‍රහ කර ඇත. ග්‍රන්ථ මාධ්‍යයේ වැදගත්කම ඉන් මැනවින් අවධාරණය වනු ඇත.

## විමර්ශිත ග්‍රන්ථ


එල්ලාවල, එම්. (2002).*පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය*.බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කාරියවසම්, ටී. (2004).*ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාව (1737-1976).*මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

දයාරත්න, බී.පී. (2006). *පොත් ප්‍රකාශනය ව්‍යාපාරයක් වශයෙන්*. පන්නිපිටිය: රුවන් ප්‍රකාශන.

වීරසිංහ, ඩබ්.කේ.එම්.කේ. (2001). *පුස්තකාල ඉතිහාසය (පුස්තකාල ආරම්භයේ සිට නූතන යුගය දක්වා සංක්ෂිප්ත විචාරණයකි).*කර්තෘ ප්‍රකාශනයකි.

සේනාරත්න, කේ.(2001). *ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාද*. කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

Crawley,W;D&Pinto-Jayawardena,K.(2015)(Eds.).Embattled Media: Democracy, Governance and Reform in Sri Lanka ,California, Singapore ,United Kingdom: SAGE

http://slap.lk/sri-lanka-print-industry-and-challenges-ahead, 2017.11.24

http://www.srilankabusiness.com/pdf/printing-and-stationery-products-ebrochures-1.pdf, 2019.02.10

http://www.accu.or.jp/appreb/report/abd/abd3032.html, 2020.01.02

http://www.sundayobserver.lk/2019/09/29/spectrum/self-publishing, 2020.01.02